# කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

**සමාජ සේවා දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ සමාජ සේවා නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022**

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන I ශ්‍රේණියේ සමාජ සේවා නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2022 වසරේ පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙමි.

01. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආර්ථික විද්‍යාව | පැය 01 1/2 | 100 | 40 |
| සමාජ විද්‍යාව | පැය 01 1/2 | 100 | 40 |
| මනෝ විද්‍යාව | පැය 01 1/2 | 100 | 40 |

**02.** පවත්වනු ලබන බලධරයා: සමාජ සේවා අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද ආයතනයක් මඟින් විභාගය පවත්වනු ලැබේ.

**03.**විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආර්ථික විද්‍යාව | ආර්ථික විද්‍යාව හැඳින්වීම, නිෂ්පාදන හා පිරිවැය න්‍යායන්, උපේක්ෂා පත්‍ර විග්‍රහය, වෙළඳපල ව්‍යුහය සහ වෙළඳපල ආකෘති, හීනවන ආන්තික ඵලදා න්‍යාය සහ පරමාණුකඵල පිළිබඳ න්‍යාය මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්තීන්, ජාතික ආදායමේ වෘත්තාකාර ප්‍රවේශය, උද්ධමනය හා සේවා වියුක්තිය, විවෘත ආර්ථික සාර්ව ප්‍රතිපත්තීන් |
| සමාජ විද්‍යාව | සමාජ විද්‍යාවේ න්‍යාය, මූලධර්ම හා පර්යේෂණ ක්‍රම, සමාජ විෂමතා සහ සමාජ ගැටලු, සමාජානුයෝජනය හා සමාජ ස්ථරායන ක්‍රම, පවුල් සංස්ථා හා අන්තර් සබඳතා |
| මනෝ විද්‍යාව | සාමාන්‍ය මනෝ විද්‍යාව, සමාජ මනෝ විද්‍යාව, ළමා මනෝ විද්‍යාව, වැඩිහිටි හා ආබාධිත පුද්ගලයන් සඳහා උපදේශනය |

**04.** නිලධාරියකුට II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට නියමිත විෂයයන් සඳහා එකම වතාවකදී හෝ වෙන වෙනම අවස්ථා කිහිපයකදී හෝ පෙනී සිටිය හැක.

**05.** *විභාගයේ භාෂා මාධ්‍යය*

I. විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.
II. අපේක්ෂකයින් කැමැති එක් භාෂාවකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතුය.
III. අපේක්ෂකයා රාජ්‍ය සේවයට ඇතුළුවීම සඳහා පෙනී සිටි තරඟ විභාගයේ භාෂා මාධ්‍යය හෝ තරඟ විභාගයක් නොමැතිව රාජ්‍ය සේවයට බැඳුනු අය සම්බන්ධයෙන් රජයේ සේවයට ඇතුළුවීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් පිළිතුරු ලිවිය හැක.

**06.** අපේක්ෂකයකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

**07.** අයදුම්පත් පහත දැක්වෙන ආකෘතියට අනුව A-4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් ඉදිරිපත් කළ යුතුය. සිංහල අයදුම්පතෙහි විභාගයේ නම සිංහලට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ අයදුම්පතෙහි විභාගයේ නම දෙමළට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද සඳහන් කළ යුතුය.අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය.

**08.** අයදුම්පත් **2022.11.25** දිනට හෝ ඊට ප්‍රථම සමාජ සේවා අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව, **2** වන මහළ, II අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**09.** විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදෙස් ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

**10.** මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින්ගේ පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අයකිරීමට තීරණය කර ඇත.අදාළ විභාග ගාස්තුව සමාජ සේවා අධ්‍යක්ෂකගේ ආදායම් ශීර්ෂ **7041285** ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ එක් දාරයක් පමණක් සිටින සේ ඇලවීම් කටයුතු කරන්න.(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

*(අ)* පළමු වතාව (සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ)

*(ආ)* ඉන්පසු එක් එක් වතාවක් සඳහා

සම්පූර්ණ විභාගය සඳහා - රු.**1200.00** යි

එක් විෂයයක් සඳහා - රු.**600** යි

**11.** විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සමාජ සේවා අධ්‍යක්ෂ විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ.එම නීතිරීති උල්ලංඝනය කළහොත් සමාජ සේවා අධ්‍යක්ෂ විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. තව ද, රටේ පවතින නිරෝධායන නීතිරීති වලටද අපේක්ෂකයන් අවනත විය යුතුය.

**12.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**13.** මෙම නිවේදනය මඟින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණ ගැනීමේ අයිතිය සමාජ සේවා අධ්‍යක්ෂක සතුය.

අනෝජා හේරත්
සමාජ සේවා අධ්‍යක්ෂ
සමාජ සේවා දෙපාර්තමේන්තුව

2022 නොවැම්බර් මස 02 වැනි බදාදා දින
බත්තරමුල්ල
සෙත්සිරිපාය
සමාජ සේවා දෙපාර්තමේන්තුවේ දී ය.

*සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය* **- 2022**

***Second Efficiency Bar Examination for Social Services Officer of the Department of Social Services - 2022***

**නිලධාරියා පෙනී සිටින භාෂා මාධ්‍යය :** **සිංහල - 2**
**දෙමළ - 3** **(අදාළ අංකය කොටුව තුළ ලියන්න)**

**(විභාගයේ නම ලිපි කවරයේ වමත් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය)**

**01. (i)** **සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :**
*උදා* **:- HERATH MUDIYANSELAGE SAMAN KUMARA**
………………………………………………………………………………………
………………………………………………………………………………………
………………………………………………………………………………………

**(ii)** **අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):**
*උදා* **:-KUMARA H.M.S.**
………………………………………………………………………………………

**(iii)** **සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්):**
………………………………………………………………………………………
………………………………………………………………………………………
………………………………………………………………………………………

**02. ලිපිනය :-**

**(i)** **විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):**………………………………………………………………
………………………………………………………………………………………
…………

**(ii)** **රාජකාරී ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්):**
………………………………………………………………………………………
………………………………………………………………………………………

**03. ජාතික හැඳුනුම්පත් අංකය :** ☐☐☐☐☐☐☐☐☐☐☐☐

**04. ස්ත්‍රී / පුරුෂ භාවය :**
**පුරුෂ - 0**
**ස්ත්‍රී - 1** ☐ **(අදාළ අංකය කොටුව තුළ ලියන්න)**

**05. ජංගම දුරකථන අංකය :** ☐☐☐☐☐☐☐☐☐☐

**06. නිවේදනයේ 01 වන ඡේදය යටතේ වගුවේ දක්වා ඇති විෂයය අංකය සහිතව විභාගයට පෙනී සිටින විෂයයන් පැහැදිලිව සඳහන් කළ යුතුය.**

| විෂයය | විෂයය අංකය |
|---|---|
| | |
| | |
| | |

**07.** උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

**08.** මෙම විභාගයට කලින් සම්පූර්ණයෙන් හෝ කොටසකට හෝ පෙනී සිටියේ නම් එසේ පෙනී සිටි වර්ෂය, විෂය හා මාධ්‍යය සඳහන් කරන්න.

| වර්ෂය | විෂයය | මාධ්‍යය |
|---|---|---|
| ........................ | ....................................... | ................................... |
| ........................ | ....................................... | ................................... |

**09.** විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

**(i)** විභාග ගාස්තුව ගෙවූ බැංකුව හා ශාඛාව: ........................................................................

**(ii)** ලදුපත් අංකය හා දිනය : ........................................................................

**(iii)** ගෙවූ මුදල : ........................................................................

| මුදල් ගෙවා ලදුපත මෙහි අලවන්න. (අදාළ නම් පමණි) |
|---|

**10.** ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, අයදුම්පතේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාගය සම්බන්ධයෙන් වන සියලුම නීතිරීති වලට එකඟ වන බවත් ප්‍රකාශ කරමි. තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සමාජ සේවා අධ්‍යක්ෂ විසින් පනවනු ලබන නීති රීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණ වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

........................................... ..................................................

දිනය අපේක්ෂකයාගේ අත්සන

*සමාජ සේවා අධ්‍යක්ෂ :*

මෙම විස්තරය දැක්වෙන අපේක්ෂකයාට / අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, අයදුම්පතේ ඔහු / ඇය විසින් සඳහන් කර ඇති භාෂා මාධ්‍යයෙන් පෙනී සිටීමට ඔයුට/ඇයට සුදුසුකම් ඇති බවත් මම සහතික කරමි.

මුදල් ගෙවූ ලදුපත ඉහත අලවා ඇති බවද ප්‍රකාශ කරමි. (*)

.................................. ..................................................

දිනය ආසන්නතම අධීක්ෂණ නිලධාරියාගේ අත්සන,
පදවි නාමය සහ නිල මුද්‍රාව

*(*) ගාස්තු ගෙවීමට අවශ්‍ය නොවේ නම් කපා හරින්න.*